
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය (කැලණිය විශ්වවිද්‍යාලය)
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
(UNIVERSITY OF KELANIYA)

# වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2013

# வருடாந்த அறிக்கையும் கணக்கும் - 2013

# ANNUAL REPORT-2013



Recommended

14. 7. 2014

# පටුන

පිටු අංකය

| | |
|---|---|
| දර්ශන ප්‍රකාශනය | 01 |
| මෙහෙවර ප්‍රකාශනය | 02 |
| ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය | 03 |
| අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය | 04 - 08 |
| ශිෂ්‍ය තොරතුරු සහ විභාග කටයුතු | 09 - 11 |
| අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර | 11 - 12 |
| වැඩසටහන් තොරතුරු | 13 - 22 |
| ආයතනයෙහි මූල්‍ය කටයුතු | 22 - 24 |
| අවසාන ගිණුම - 2013 | 25 - 33 |
| පසුගිය වර්ෂ 05ක ආයතනයේ මූල්‍ය තත්වය | 34 |
| විගණකාධිපති වාර්තාව - 2013 හා පිළිතුරු | 35 - 47 |

## 01. දර්ශන ප්‍රකාශනය

# දර්ශන ප්‍රකාශනය

බෞද්ධ මූලාශ්‍රය ග්‍රන්ථ, බෞද්ධ චින්තනය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ සාමූහික අධ්‍යයනයන් හා පර්යේෂණයන් සම්බන්ධීකරණය කෙරෙහි මූලික අවධානයකින් යුතුව ලෝකයේ බෞද්ධ අධ්‍යයන හා පර්යේෂණ සම්බන්ධ ශ්‍රේෂ්ඨතම මධ්‍යස්ථානයක් බවට පත් කිරීමයි.

**02.** මෙහෙවර ප්‍රකාශනය

## මෙහෙවර ප්‍රකාශනය

**බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි අවබෝධය, ආකල්ප හා පර්යේෂණ කුශලතාවන් සංවර්ධනය කිරීම සඳහා ශක්ති පමණින් විද්‍යාර්ථීන්ට හොඳම අවස්ථාවන් හා පහසුකම් නිර්මාණය කර දීමේ පුරෝගාමීන් ලෙස කටයුතු කිරීමයි.**

# 03. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය

| | |
|---|---|
| 01. කුලපති | ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය, පණ්ඩිත, අතිපූජ්‍ය වැලමිටියාවේ ධම්මකිර්ති ශ්‍රී කුසලධම්ම නාහිමිපාණෝ බී.ඒ. ගෞරව (විද්‍යාලංකාර) |
| 02. උපකුලපති | මහාචාර්ය සරත් අමුණුගම මහතා<br>Licence es Lettres (Sorbonne), M.A. (Sorbonne), PhD (Sorbonne), P.G. Dip. (Sorbonne), DESS (Borugogne) |
| 03. අධ්‍යක්ෂ | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජී.ඩී. සුමනපාල මහතා<br>බී.ඒ. ගෞරව, එම්.ඒ, පීඑච්ඩී, ප්‍රාචීන පණ්ඩිත<br>(2007.10.15 සිට 2013.10.14 දක්වා) |
| | පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි<br>B.A. (Hons), M.A., PhD<br>(2013.10.15 සිට) |
| 04. ලේඛකාධිකාරී | ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා<br>බී.එස්සි Pub. Ad (ශ්‍රී ජයවර්ධනපුර), MSSc. (කැලණිය)<br>SATSL.LICA |
| 05. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | රසිකා සුබසිංහ මහත්මිය (සප්තවාර්ෂික හා අධ්‍යයන නිවාඩු) |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (වැඩ බලන) | ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා<br>(BSc.) |
| 06. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | පී.බී. අබේසේකර මහතා (2013.04.12 දක්වා)<br>D.P.F.M. (SLIDA) |
| | ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය<br>B.Sc. Business Admn(Sp) (SJP)<br>(2013.05.02 දින සිට) |
| 07. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය<br>බී.ඒ. ගෞරව, එම්.ඒ (කැලණිය)<br>MLSc. (කොළඹ) |
| 08. සහකාර ලේඛකාධිකාරී | ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා<br>(BSc.) |

# 04. අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය :

## (අ) කෙටි හැඳින්වීම

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම 2013 ජනවාරි 21 වැනි දින සිට සිදු කරන ලදී. නව අධ්‍යයන වර්ෂය 2013 පෙබරවාරි මස 15 වැනි දින සිට ආරම්භ විය. එක් වාර්ෂික අධ්‍යයන පාඨමාලා සඳහා දේශීය හා විදේශීය සිසුන් 414 දෙනෙකු ලියාපදිංචි වී ඇත. ආයතනයේ ස්ථිර ආචාර්ය මණ්ඩලයේ සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 04 දෙනෙකු, බාහිර ආචාර්ය මණ්ඩලයේ 07 දෙනෙකු සහ ආයතන අධ්‍යක්ෂවරයා මෙම පාඨමාලා වල ඉගැන්වීම් කටයුතු හා ඇගයීම් කටයුතු සිදු කරන ලදී. ආයතනයේ බෞද්ධායුර්වේද උපදේශන පාඨමාලා සඳහා ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ ඉල්ලීමක් අනුව ආයුර්වේද ශාස්ත්‍රී සහතිකය හා වර්ෂ 05ක පළපුරුද්දක් සහිත අයදුම්කරුවන්ට ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා ආයතනයේ පියසභාවට අධ්‍යක්ෂතුමා විසින් කරන ලද යෝජනාවක් අනුව එහි නිර්දේශය මත කැලණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. 2012 වර්ෂයේ දෙසැම්බර් මස පවත්වන ලද අවසාන විභාග වල ප්‍රතිඵල 2013 අප්‍රේල් මස 11 වැනි දින නිකුත් කරන ලදී. 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද එක් අවුරුදු පාඨමාලාවල වර්ෂාවසාන විභාග එම වර්ෂයේ දෙසැම්බර් මස පවත්වන ලදී.

ආයතනයට ඉඩමක් ලබා ගැනීම හා එහි ගොඩනැගිල්ලක් ඉදිකිරීම් පිළිබඳ කටයුතු සඳහා කළමනාකාර මණ්ඩලයෙහි ද උපදෙස් අනුව කටයුතු කරන ලදී. කෙසේ වෙතත් එම ඉලක්කට 2013 වර්ෂය තුළදී සපුරා ගැනීමට නොහැකි විය.

ආයතනයේ පුරප්පාඩුව පැවැති ලිපිකරු තනතුරු 02ක්, පරිගණක යෙදුම් සහකාර තනතුරු 01ක් හා පුස්තකාල සහකාර තනතුරු 01 සඳහා නව බඳවා ගැනීම් සිදු කරන ලදී.

ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය 2013.10.15 වැනි දින සිට පුරප්පාඩු වීමට නියමිතව තිබූ බැවින් ඒ සඳහා නියමිත පරිදි අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නම් කළ පරිදි පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමියෝ 2013.10.15 වැනි දින සිට අධ්‍යක්ෂ වශයෙන් පත් වූහ.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ මූලාශ්‍රය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ උසස් අධ්‍යයන හා පර්යේෂණ සඳහා වෙන් වූ එකම ආයතනයයි. වර්තමානයේ එහි පහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

| Course ID | Course Name | Course Sinhala Name | Exam Name |
|---|---|---|---|
| 01 | Postgraduate Diploma in Buddhist Studies (S/E) | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය |
| 02 | Master of Arts Degree in Buddhist Studies (S/E) | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය |
| 03 | Postgraduate Diploma in Pali Studies (S) | පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය |
| 04 | Master of Arts Degree in Pali Studies (S) | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය |
| 05 | Master of Philosophy (S/E) | දර්ශනපති අධ්‍යයන පර්යේෂණ | දර්ශනපති උපාධි පරීක්ෂණය |
| 06 | Doctor of Philosophy (S/E) | දර්ශන විශාරද අධ්‍යයන පර්යේෂණ | දර්ශන විශාරද උපාධි පරීක්ෂණය |
| 07 | Postgraduate Diploma course in Buddhist Ayurvedic Counselling (S/E) | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය |
| 08 | Master of Arts Degree Course in Buddhist Ayurvedic Counselling (S/E) | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය |
| Extra Course | | | |
| 09 | Basic Pali & Sanskrit Course | | |
| 10 | English Through Buddhism | | |
| 11 | Source Studies, Research Methodology and Logical Thinking | | |

ඉහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් හදාරණ ලද ශිෂ්‍ය සංඛ්‍යා පහත දැක්වේ.

| | |
|---|---|
| ඩිප්ලෝමා | - 53 |
| ශාස්ත්‍රපති | - 396 |
| දර්ශනපති | - 130 |
| දර්ශන විශාරද | - 79 |
| | 669 |


මෙම ආයතනය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට ස්ථානයකට පත් කරලීම අපගේ පරමාර්ථයයි.

## (ආ) ජයග්‍රහණ

පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ජාතික ජාත්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයට අදාළ කටයුතු උසස් තත්වයකට පත් කිරීමට අප සමත් වී ඇත.

### සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව

| | ජාතික | ජාත්‍යන්තර |
|---|---|---|
| 1. 2009 | 200 | 140 |
| 2. 2010 | 274 | 116 |
| 3. 2011 | 206 | 141 |
| 4. 2012 | 164 | 133 |
| 5. 2013 | 186 | 134 |



## (ඇ) පසුබෑසීම් හා සාධාරණීකරණය.

මෙම ආයතනයට වසර තිහකට අධික ඉතිහාසයකට හිමිකම් ඇතත් මේ දක්වා ඊට ස්ථිර භූමිභාගයක් හෝ ගොඩනැගිල්ලක් ලබා ගැනීමට හැකි වී නොමැත. මෙතෙක් මෙම ආයතනය පවත්වා ඇත්තේ කුලියට ලබා ගත් ගොඩනැගිලිවලය. අදාළ බලධාරීන් හා ආයතනයන් දැනුවත් කරමින් මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා අඛණ්ඩ උත්සාහයක් ගෙන ඇතත් මේ දක්වා එය අංග සම්පූර්ණව සාර්ථක වී නොමැත. ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටළුව ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය.

## (ඈ) අනාගත සැලසුම්.

බෞද්ධායුර්වේද උපදේශන ප්‍රතිකාර සඳහා මධ්‍යස්ථාන දෙකක් ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර ඒ පිළිබඳ දර්ශනපති හා දර්ශන විශාරද පර්යේෂණ ආරම්භ කිරීමට ද අදහස් කරනු ලැබේ. තවද මේ සඳහා ආයතනයේ 'ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශයක්' ස්ථාපිත කිරීමට යෝජනා වී ඇත.

බෞද්ධ සන්නිවේදනය හා බුදුදහම හා නීතිය පිළිබඳ පාඨමාලා දෙකක් යථාකාලයේදී හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

ආයතනයට ස්ථිර ඉඩමක් හා ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය කරන ව්‍යාපෘති වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ඇතුළු අංශ ප්‍රධානවරුන්ගේ හා සියලු කාර්ය මණ්ඩල වල දායකත්වයෙන් සකස් කර ගෙන යනු ලැබේ.

ථේරවාද බෞද්ධ අධ්‍යයනය වඩා ප්‍රචලිත කිරීම සඳහා හොංකොං හි බෞද්ධ අධ්‍යයන පාඨමාලා ආරම්භ කිරීම පිණිස අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය. දැනට සිංගප්පූරුවේ පවත්වනු ලබන පාඨමාලා සඳහා වඩා විධිමත් පරිදි කටයුතු කිරීමට නව අවබෝධතා ගිවිසුමකට එළඹීමට නියමිතය.

## (ඉ) වෘත්තීය අවස්ථා

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ වෘත්තීය අවස්ථා රාශියක්ද ශ්‍රී ලංකාවේ පවතී. කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලයන්හි පාලි හා බෞද්ධ අධ්‍යයන අංශ ක්‍රියාත්මක වේ. අනුරාධපුර බුද්ධශ්‍රාවක විශ්වවිද්‍යාලය හා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාල දෙකකි. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ද එම විෂය ක්ෂේත්‍රය සඳහාම වෙන් වූ ආයතනයකි. තව ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන 733ක් පමණ වන පිරිවෙන්වල ප්‍රධාන විෂයධාරාව වනුයේ පාලි හා බෞද්ධ අධ්‍යයනයන්ය. ශ්‍රී ලංකාවේ පාසැල්වල බුද්ධධර්මය හා බෞද්ධ සංස්කෘතිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව විසිදහසකට ආසන්නය. ඉහත සඳහන් විශ්වවිද්‍යාල, ආයතන හා පාඨශාලාවන්හි අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා ආචාර්යවරුන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. අප ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා සම්පූර්ණ කරන ලද භික්ෂූන් වහන්සේලා හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් රාශියක් ඉහත සඳහන් ආයතනවල අධ්‍යාපන, පර්යේෂණ කටයුතු වල යෙදී සිටිති. අපගේ අවබෝධයට අනුව මෙම පාඨමාලා අවසන් කළ කිසිවකු තම අභිමතය නිසා මිස රැකියා විරහිතව නොමැති බව සඳහන් කළ යුතුය.

මේ හැරුණු විට වර්තමාන ලෝකයේ ධර්ම ප්‍රචාරය සඳහා විශාල වශයෙන් භික්ෂූන් වහන්සේලා අවශ්‍ය වී ඇත. අප ආයතනයේ පාඨමාලා අවසන් කළ දේශීය හා විදේශීය භික්ෂූන් වහන්සේලා රාශියක් විදේශ රටවල ධර්ම ප්‍රචාරයේ යෙදී සිටිති.

හොංකොං විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයෙහි අධ්‍යක්ෂ ධූරය දරනුයේ ද මෙම ආයතනයේ ආචාර්ය උපාධිය හැදෑරූ ස්වාමීන් වහන්සේ නමකි. ලෝක විශ්වවිද්‍යාල සංගමයේ ලේඛකාධිකාරී හා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතු වල යෙදෙන ආචාර්ය කම්මායිධම්මසාමි හිමියෝද මෙහි ආචාර්ය උපාධිය හදාළ කෙනෙකි. කාම්බෝජයේ විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක නිලයක් දරනුයේ අප ආයතනයේ අධ්‍යයන කටයුතු සිදු කළ හිමි නමකි. තව ද ලෝකයේ බෞද්ධ ආයතන රැසක අප ආයතනයේ පශ්චාත් උපාධි ලබාගත් ශිෂ්‍ය හිමිවරු සේවය කරති. මේ අයුරින් සලකා බලන විට අප අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාටම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා දේශාන්තරව පවතින බව සඳහන් කළ හැකිය.

මෙම ආයතනය පශ්චාත් උපාධි ආයතනයක් නිසා බොහෝ විට ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙක් රැකියා වල නිරත වූ අය වෙති. ඔවුහු ඔවුන්ගේ උසස්වීම සඳහා මෙහිදී පශ්චාත් උපාධි හදාරන අය වෙති.එමෙන්ම තවත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් රැකියාවෙන් පසු විශ්‍රාම ලබා බෞද්ධ අධ්‍යයනය හදාරති. එමනිසා රැකියා පිළිබඳ ගැටලුවක් මෙම උපාධිධාරීන් සම්බන්ධයෙන් උද්ගත නොවන බව සඳහන් කළ යුතුය.

# 05. සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යා ලේඛනය - 2013

| පාඨමාලාව | ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 12 | |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 15 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 188 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 195 | ස්ථිර කාර්ය මණ්ඩලය |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 16 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - 01<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii - 02 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 11 | |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 19 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii - 02<br>(2012.07.31 සිට) |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 113 | විද්‍යාත්මක සහකාර - 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 31 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 36 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 25 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව- බාහිර ( ඉංග්‍රීසි මාධ්‍යය) | 05 | |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර | 05 | |
| එකතුව | 669 | |

# 06. පාඨමාලාව සම්පූර්ණ කළ දේශීය ශිෂ්‍යයෝ - 2013

| පාඨමාලාව | මාධ්‍යය | විභාගයට පෙනී සිටි (2013) | පෙර වර්ෂයේ විභාගයට පෙනී සිටි (2012) |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 09 | 09 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 02 | 05 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 134 | 132 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 10 | 07 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 10 | 16 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 10 | 08 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 19 | 16 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | සිංහල | 02 | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | සිංහල | 05 | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 06 | 01 |
| | | 207 | 196 |

## 07. පාඨමාලාව සම්පූර්ණ කළ විදේශීය ශිෂ්‍යයෝ - 2013

| පාඨමාලාව | මාධ්‍යය | විභාගයට පෙනී සිටි (2013) | පෙර වර්ෂයේ විභාගයට පෙනී සිටි (2012) |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 08 | 16 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 167 | 174 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 06 | 02 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර | ඉංග්‍රීසි | 03 | 08 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව- බාහිර | ඉංග්‍රීසි | 05 | 05 |
| | | 205 | 172 |

## 08. අධ්‍යයන කාර්ය මණ්ඩලය

| දෙපාර්තමේන්තුව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර ii ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | 01 | - | - |
| බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | 02 | - | - |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | 01 | - | - |
| පර්යේෂණ අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | - | - | 01 |
| එකතුව | | - | - | 04 | - | 01 |

# 09. පරිපාලන කාර්ය මණ්ඩල විස්තර

අධ්‍යක්ෂ - 01

| පීඨය/අංශය | අංශ ප්‍රධාන | කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| පාලන අංශය | *ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 01 | *ලඝුලේඛක (සිංහල) i ශ්‍රේණිය - 01<br>*ලිපිකරු iii ශ්‍රේණිය - 03 | *රියදුරු ii ශ්‍රේණිය -02 | *කම්කරු(විශේෂ ශ්‍රේණිය ) - 02<br>කම්කරු (iii ශ්‍රේණිය) - 01 |
| ගිණුම් අංශය | * ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී - 01 | *ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු) - 01<br>*ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) - 01<br>*සරප් මාණ්ඩලික සහකාර - 01<br>ගබඩා භාරකරු iii ශ්‍රේණිය - 01 | | |
| පුස්තකාලය | *ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01 | *පුස්තකාල සහකාර iii ශ්‍රේණිය - 02 | *පුස්තකාල සහායක ii ශ්‍රේණිය - 02 | |
| විභාග හා ශිෂ්‍ය කටයුතු අංශය | *සහකාර ලේඛකාධිකාරී - 01 | *පරිගණක යෙදුම් සහකාර iii ශ්‍රේණිය- 02 | | |
| එකතුව | 04 | 12 | 04 | 03 |

# 10. පර්යේෂණ, නව සම්පාදන සහ ප්‍රකාශන :

## 2013 වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි

### දර්ශනවිශාරද උපාධිය(සිංහල මාධ්‍යය)

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂකයාගේ රට |
|---|---|---|---|
| පූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලංකාර හිමි | දර්ශන විශාරද | ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය : සංස්කරණය හා නවීකරණය නුවර යුගයේ සිට වර්තමානය දක්වා. | ශ්‍රී ලංකාව |
| විජයදාස රාජපක්ෂ මහතා | දර්ශන විශාරද | බෞද්ධ ධාර්මිකත්ව සංකල්පය හා නූතන යුක්ති විනිශ්චය ක්‍රමෝපායයන් පිළිබඳ අධ්‍යයනයක්. | ශ්‍රී ලංකාව |
| හසන්ත ශ්‍රී ලාල් හෙට්ටිආරච්චි මහතා | දර්ශන විශාරද | චතුපටිසම්භිදා හා තසනුගත ඉගැන්වීම් වලින් ප්‍රකට වන බෞද්ධ සන්නිවේදන සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්. | ශ්‍රී ලංකාව |
| ඩබ්ලිව්.ඒ. ගාමිණි විජයසිංහ මහතා | දර්ශන විශාරද | ශ්‍රී ලාංකික සමාජය කෙරෙහි බෞද්ධ සංස්කෘතික සංකල්ප සම්ප්‍රේෂණයෙහි ලා කලා නිර්මාණයන්ගේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්. | ශ්‍රී ලංකාව |

### දර්ශනපති උපාධිය(සිංහල මාධ්‍යය)

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂකයාගේ රට |
|---|---|---|---|
| පූජ්‍ය අම්පාරේ ආනන්ද හිමි | දර්ශනපති | ශ්‍රී ලාංකේය අභිචාර විධීන්හි දක්නට ලැබෙන බෞද්ධාගාමික ආභාසය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්. | ශ්‍රී ලංකාව |
| ටී.එච්. නිලන්ත ඉන්දික මහතා | දර්ශනපති | කොළඹ ජාතික කෞතුකාගාරයේ පවතින බෞද්ධ සම්ප්‍රදාය නියෝජනය කරන පුස්කොළ පිටපත් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්. | ශ්‍රී ලංකාව |

<u>දර්ශනවිශාරද උපාධිලාභීන් - ඉංග්‍රීසි මාධ්‍යය</u>

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂකයාගේ රට |
|---|---|---|---|
| Mr. Kim Han Sang | දර්ශනවිශාරද | An Analytical Study of the Buddhist Concept of Food (Āhāra) with Reference to Bothe Theravāda and Mahāyana Traditions | දකුණු කොරියාව |
| Ven. K. Dhammadinna | දර්ශනවිශාරද | A Critical Study of the Cultural Background of the Ancient Suvarnabhumi with special reference to Malaysia | මැලේසියාව |
| Rev. Sasminto | දර්ශනවිශාරද | A Comparative Study of the Psychological Process of Sense Experience with reference to the Pali Discourses and Exegetical Literature | ඉන්දුනීසියාව |
| Rev. Sentot | දර්ශනවිශාරද | An Analytical Study of the Buddhist Concept of Nivarana | ඉන්දුනීසියාව |
| Rev. An Chong Ae | දර්ශනවිශාරද | A Analytical Study of the Concept of Purification (Visuddhi) in Early Buddhism and Theravada with special reference to Sattavisddhi | කොරියාව |
| Ven. Li Hui Xia | දර්ශනවිශාරද | A Comparative Study of the Social Ethics in Buddhism and Confucianism | චීනය |
| Ms. D.K.S. Bhagya | දර්ශනවිශාරද | A Analytical Study of Debates and Dialogues: A Cultural Approach | ශ්‍රී ලංකාව |
| Mrs. C.I. Jinadasa | දර්ශනවිශාරද | Buddhist Critiques of the Modern Concept of Material Development: An Analytical Study | ශ්‍රී ලංකාව |
| Ven. Kaccayana | දර්ශනවිශාරද | A Critical Study of the History of Theravada Buddhism in Burma from the Pagan Period to the Konbaung Period (10th Century AD – 19th Century AD) | මියන්මාරය |

| | | | |
|---|---|---|---|
| Ven. Eindasara | දර්ශනවිශාරද | A Critical Study of the Historical Development of the Subject Matter Related to Dhammānupassanā in Theravada Buddhist Tradition | මියන්මාරය |
| Ven. Chen Shiying (Qin Dao) | දර්ශනවිශාරද | Application of the Concept of Brahma in Buddhist Contexts: A Critical Study | චීනය |

## 11. වැඩසටහන්, දේශන හා වැඩමුළු :

<u>ආචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා</u>
<u>(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/අධ්‍යයනාංශ ප්‍රධාන-බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය)</u>

<u>ශාස්ත්‍රීය ලිපි</u>

(01) අපේක්ෂාභංගත්වය හමුවේ බුදුදහම, නිවන්මඟ_සඟරාව, රජයේ මුද්‍රණාලිය බෞද්ධ සංගමය - 2013
(02) මහලුවිය පිළිබඳ බෞද්ධ දැක්ම හෙවත් බෞද්ධ වෘද්ධ මනෝචිකිත්සාව. උපදේශන හා සමාජසේවා දෙපාර්තමෙන්තුව, 2013
(03) ස්ත්‍රී මනෝවිද්‍යාව, බෞද්ධ ප්‍රවේශයන්, අනුපද, 2013

<u>විශේෂ දේශන පැවැත්වීම.</u>

(01) බුදුසමයේ මනෝවිද්‍යාත්මක පදනම, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, 2013

(02)අපරාධ නිවාරණය සහ චිත්තවේග කළමනාකාරණය උදෙසා උපදේශන මනෝවිද්‍යාව, පොලිස් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩ මුළුව, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, මඳුරාවල, අඟුරුවාතොට, 2013.

(03) බෞද්ධ මනෝචිකිත්සාව, භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2013.

(04) බෞද්ධ මනෝචිකිත්සාව භික්ෂු ආකල්ප ප්‍රවර්ධන සහ භික්ෂු පුහුණු වැඩසටහන, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, 2013.

<u>පර්යේෂණ පත්‍රිකා</u>

(01) Applicability of Mettābhāvanā for the elimination of Problematic behaviours and Psychological disorders in the global context International Conference on Buddhist Heritage if odisha: Department of Tourism and Culture' Government of Odisha. – 2013

(02) Geropsychiatric Aspects in Early Buddhist Teachings – SriLanka Association of Buddhist Studies (SLABS) – 2013

(03) Adoption of Early Buddhist Teachings for Counseling Purposes : SriLanka Association of Buddhist Studies (SLABS) – 2013

<u>දේශීය දේශන</u>

(01) Buddhism and Psychotherapy I.B.C. Thailand, 2013
(02) Buddhist Counselling – Kvalalampure, Malaysia - 2013
(03) Buddhist Counselling – Penang, Malaysia – 2013

<u>නව විෂයමාලා හඳුන්වාදීම</u>.

(01) Buddhist Psychotherapy, Counselling I.B.C. Affiliated College,Malaysia, 2013

<u>ඩබ්ලිව්.එම්.දේශප්‍රිය ගුණසේන මහතා</u>
<u>(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය)</u>

<u>ශාස්ත්‍රීය ලිපි</u>

1. ඉඳුරන් පිනවීම : බුදුසමයේ විග්‍රහය. නිවන් මග සඟරාව, රජයේ මුද්‍රණාලයේ ප්‍රකාශනය, 2013

2. ශ්‍රාවක - ශ්‍රාවික චරිත තුළින් ප්‍රකට වන කුසලාකුසල සංකල්පය, නේත්‍රා ශාස්ත්‍රිය සංග්‍රහය, 2013
3. භාෂා භාවිතය පිළිබඳ බෞද්ධ විග්‍රහය, සාරජී ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය, 2013

4. නෙත්තිප්පකරණ විවරණ සම්ප්‍රදාය, සාර සංග්‍රහය, 2013

5. ධර්මාර්ථ විවරණයෙහිලා අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ පාදයන් වහන්සේගේ අනන්‍යතාව හඳුනා ගැනීම.
   ප්‍රතිභා ශාස්ත්‍රිය සංග්‍රහය, 2013

6. Buddhist Meditation its Significance in Relation to Nibbana. සම්මානනී ශාස්ත්‍රීය සංග්‍රහය, 2013

<u>ග්‍රන්ථ</u>

බුදුසමයේ පෞරුෂත්ව විශ්ලේෂණය, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍රකාශනය,2013

## පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි
## (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය)

### Research Papers Presented (Seminars and Workshop)

### (in English)

'Search for Foundations of Buddhist Culture by Redefining Kālāmasutta for Justification of Emergence of Mahayana' presented to the 5th International Buddhist Conference Sri Lanka Association of Buddhist Studies, held in September 2013, in Colombo'

'Tapassu and Bhallika's Meeting of the Buddha Represented by Classical Buddhist Artists of Ancient Sri Lanka' presented to the International Conference on Buddhist Heritage of Odisha organized by Department of Tourism and Culture, Governmnet of Odisha held in February 2013 at Udayagiri' Odisha'

Early Buddhist Terminology to Express Existence' presented to the 6th Research Conference of the Royal Asiatic Society of Sri Lanka held in March, 2013 at Royal Asiatic Society, Colombo.

### Publications
### Book Review

Theravada Buddhism : The View of the Elders by Professor Asanga Tilakaratne (Book Review for Vijjāvimutti, Adademic Volume of Buddhist and Pali College – 2013 (Chief Editor – Ven. Dr. R. Chandawimala)

පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - බෞද්ධ දර්ශන අධ්‍යයන අංශය)

Sinhala Medium

i. A Need of Timely and Monastic Educational System for Sri Lankan Buddhist Monks, Abhivandana (ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේ උදෙසා කාලීන හා ආරාමීය අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාව) : A felicitation to Ven. Makulewe Vimala Thero, Ministry of Mass Communication : Sri Lanka, 2013. Pp 74-80

ii. The Path to Liberation : Theravada Buddhist Aspect in Great Compassion): (විමුක්ති මාර්ගය: මහා කරුණාව පිළිබඳ ථෙරවාද විවරණය) a felicitation to Ven. Bootawatte Saranankara, edited by Wimalabuddhi, U. & Dhamminda, G., Nittambuwa: Samadhi Graphics, Sri Lanka, 2013, Pp. 71 - 91

iii. Forward to Buddhist Teachings for a Successful Life,(සාර්ථක ගෘහ ජීවිතයක් සඳහා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව - පෙරවදන) Jinaratana, M. Kurunegala: Asliya Printers, 2013, pp. 3-4

iv. Forward to Modern Trends of Sri Lankan Buddhism,(ලාංකේය බුදුසමයේ නූතන ප්‍රවණතා කෘතියෙහි පෙරවදන), Dhammaransi, M. Colombo: Godage Publishers, 2013, Pp.vii-xi

v. A Critique on the Third of the Seven Aparihaniya dhamma taught to Vajjins (සප්ත අපරිහානීය ධර්මයෙහි ප්‍රකට තෙවැනි අපරිහානිය ධර්මය පිළිබඳ විවරණයක්) in Pariyatti, edited Revata, Ven. Eswatte, et al., Pariyatti Samvaddhana Sabha of Sri Lanka Ramanna Maha Nikaya, 2013' Pp. 38-44

Translations of Articles from English to Sinhalese:

i. Translation of "Memories of Ceylon"(ලංකාව පිළිබඳ මතක), by Geheimrath Dr. W. Geiger, in Abhiprasada: Essays in Honour of Udugampola Piyananda Thero, edited Dhammapala Ven. Akmeemana et al., Diwulapitiya: Saraswati Publication, 2013. Pp. 48-57

Articles in English

i. Shared Moral Responsibility : A Comparative Study between Mellama's Buddhist Account in the Felicitation Volume: The Most Ven. Napane Pemasiri Maha Thero, the Chief Prelate of Sri Lanka RamannaMaha Nikaya, edited by Anand, Ven. Prof. Kongastenne at el.Colombo 08: State Printing Department, 2013. Pp. 538-549

Conferences: Local and International

i. Holding Two Opposite Positions on One Issue : Theravada Buddhist Positions on the Social Hierarchy, National Conference of Bhiksu University of Sri Lanka, Anuradhapura, December, 2013.

ii. Buddhism for Anger Management : a Study on Buddhist Rationale, 5th Bi-Annual International Conference of SLABS, September, 2013.

iii. The Buddha beside the Roads: A Study on the New Trend of Erecting Buddha Statues and its utility, 5th Bi-Annual International Conference of SLABS, September 2013.

<u>News Paper Articles in Sinhalese Medium:</u>

**(චීවර පාරුපණය පිළිබඳ මතවාද), Debate on Wearing Robe: over one Shoulder and around both Shoulders, Sasauna: official News Paper of Ramanna Sector in Sri Lanka, December, 2013.**

**Anusasanawa (අනුසාසනාව ) Sasauna: Official News Paper of Ramanna Sector in Sri Lanka, September, 2013.**

**International Work Experiences:**

**i. Director of the Novitiate Programme of Buddhist Maha Wihara, Kualalumpore, Malaysia, from 15th November, 2013. (Dhamma talks, Dhamma classes, Directing the entire programme)**

<u>පර්යේෂණ ඒකකය</u>
<u>පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි</u>
<u>විද්‍යාත්මක සහකාර</u>

ආයතනයෙහි පර්යේෂණ අංශය මගින් අන්වේෂණා සඟරාව (2013) සඳහා ලිපි ලබා ගෙන ඒවා ඒ ඒ ක්ෂෙත්‍රයෙහි නෛපුණ්‍යතාවකින් හෙබි ආචාර්ය මහාචාර්යවරුන් ලවා පරීක්ෂා කොට ඇත. දැනට ලිපි 16ක් පමණ එසේ පරීක්ෂා කොට ඇති බැවින් ආයතනයෙහි ක්‍රමවේදයට අනුව මුද්‍රණයට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. 2013 වසරේ දර්ශනපති ආචාර්ය උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් වෙනුවෙන් වැඩමුළු 10ක් ඉංග්‍රීසි සිංහල මාධ්‍ය දෙකෙන් ම සිදුකර ඇත. ශාස්ත්‍රපති හා ඩිප්ලෝමා උපාධි අපේක්ෂකයන්ට අවශ්‍ය අවස්ථාවන්හි දී තම පර්යේෂණ උපාධි පත්‍රිකා සකස් කර ගැනීමට අප ඒකකය මගින් කරනු ලැබේ. තව ද ආචාර්ය උපාධියට හා දර්ශනපති උපාධියට ලියාපදිංචි වූ ශිෂ්‍යයන්ට තමා තෝරා ගත් මාතෘකාව පර්යේෂණ මාතෘකාවක් වන්නේ ද නොවන්නේ ද යන්න තේරුම් ගැනීමට ද ඔවුන්ගේ පර්යේෂණ යෝජනා සකස් කර ගැනීමට ද උපදෙස් දීම ආදී කටයුතු ද මෙම පර්යේෂණ ඒකකය මගින් සිදු කෙරේ.

## 12. ත්‍යාග ප්‍රදානයන්

| විෂය | තිළිණ ප්‍රමාණය | ප්‍රදානය |
|---|---|---|
| (අ) දේශීය තිළිණ ලාභීන් | 01 | ස්වර්ණ මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) පින්දෙනියගේ දෝන සුවිමාලි රාජිනි ගුණසේකර මෙනෙවිය |
| | 01 | රජත මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා) Ven. Julia Surya |
| එකතුව | 2 | |

## 13. අලුතින් ආරම්භ කළ පාඨමාලා : නැත

## 14. පුනරාවර්තන වියදම් -

| විෂයය | 2012 රු.ශත | 2013 රු.ශත | වෙනස |
|---|---|---|---|
| (අ) වැටුප් හා වේතන | 18,595,187 | 23,051,791 | 4,456,604 |
| (ආ) ගමන් වියදම් | 469,260 | 90,469 | -378,791 |
| (ඇ) සැපයුම් | 1,681,806 | 1,986,845 | 305,039 |
| (ඈ) නඩත්තු | 512,393 | 789,693 | 277,300 |
| (ඉ) බැඳුම්ගත සේවා | 7,741,277 | 7,479,607 | -261,670 |
| (ඊ) වෙනත් | 6,074,209 | 7,960,793 | 1,886,584 |
| එකතුව | 35,074,132 | 41,359,198 | 6,385,066 |

## 15. ප්‍රාග්ධන වියදම් -

| විෂයය | 2012 (රු.ශත) | 2013 (රු.ශත) | වෙනස |
|---|---|---|---|
| (අ) ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම. | 813,167 | 853,185 | -40,018 |
| (ආ) යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම. | 0 | 0 | 0 |
| (ඉ) ගොඩනැගිලි | 0 | 0 | 0 |
| (ඊ) වෙනත් | 442,294 | 333,397 | 108,897 |
| එකතුව | 1,255,461 | 1,186,582 | 68,879 |

## 16. මූල්‍යමය ප්‍රගතිය (වියදම්) -

| විෂයය | වෙන් කිරීම් | | වියදම | | අතිරික්ත/ඌනතාව (රු.ශත) | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 |
| (අ) පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 35,785,000 | 40,790,000 | 35,074,132 | 39,206,998 | 710,868 | 1,583,002 |
| (ආ) ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර) | 1,600,000 | 2,550,000 | 1,255,460 | 1,186,582 | 344,540 | 1,363,418 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ආයෝජන | 0 | 3,660,000 | 0 | 2,152,199 | 0 | 0 |
| (ඇ) ව්‍යාපෘති - විදේශීය ආයෝජන | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 37,385,000 | 47,000,000 | 36,329,592 | 42,545,779 | 1,055,408 | 2,946,420 |

## 17. මූල්‍යමය ප්‍රගති විස්තරය (උපයන ලද ආදායම) –

| ආදායම් මාර්ග | වෙන් කිරීම් (රු. ශත) | | එකතුව (රු.ශත) | | වෙන් කිරීම් (රු.ශත) | එකතුව (රු.ශත) |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 |
| (අ) උපාධි අපේක්ෂක | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ආ) පශ්චාත් උපාධි | 20,250,000 | 28,613,000 | 21,826,219 | 18,946,997 | -1,576,219 | 9,666,003 |
| (ඇ) උපදේශන සේවා | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ඇ) වෙනත් | 5,535,000 | 4,420,000 | 2,238,483 | 4,119,759 | 3,296,517 | 300,241 |
| එකතුව | 25,785,000 | 33,033,000 | 24,064,702 | 23,066,756 | 1,720,298 | 9,966,324 |

## 18. මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2012

| විෂයය | ක්‍රමය | එක් සිසුවකු සඳහා වියදම | |
|---|---|---|---|
| | | 2012 | 2013 |
| (අ) එක් සිසුවකු සඳහා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම<br>ශිෂ්‍ය සංඛ්‍යාව | 50,034 | 61,822 |
| (ආ) එක් සිසුවකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම<br>ශිෂ්‍ය සංඛ්‍යාව | 1,791 | 1,774 |
| එකතුව | | 51,825 | 63,596 |

## 19. වාර්තාව සඳහා අදාළ වෙනත් තොරතුරු.

01. අවසාන ගිණුම - 2013
02. 2009- 2013 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.අවසාන ගිණුම - 2013
03. කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(02) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු

Postgraduate Institute of Pali and Buddhist Studies
(University of Kelaniya)

# Final Accounts
# 2013

No.113,
Dutugamunu Street
Kohuwala.

## 2013 වර්ෂයේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ කැලණිය විශ්විද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනයේ තිස් පස්වැනි (35) වර්ෂයේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාවයි.

2013 වර්ෂය සඳහා ලැබුණු ආධාර ප්‍රමාණය මෙසේ ය.

| | | |
|---|---|---|
| පුනරාවර්තන ආධාර | රු. | 11,417,000.00 |
| 102- මූලධන ආධාර | රු. | 2,550,000.00 |

රජයෙන් ලැබුණු ආධාර මුදල් ද ඇතුළුව මෙම වර්ෂයේ සම්පූර්ණ පුනරාවර්තන ආදායම රුපියල් තුන්කෝටි හැත්ත අටලක්ෂ අනූඑක්දහස් පන්සිය හැටපහ (රු. 37,891,565)ක් වූ අතර පුනරාවර්තන වියදම රුපියල් හාරකෝටි දහතුන්ලක්ෂ පනස්නමදහස් එකසිය අනූහත (රු. 41,359,197)ක් විය. මේ අනුව පුනරාවර්තන මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය රුපියල් තිස්හතරලක්ෂ හැටහත්දහස් හයසිය තිස්දෙක (රු. 3,467,632) ක ඌණතාවකි.


(පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි)

අධ්‍යක්ෂ

## 2013 වර්ෂයේ වාර්ෂික ගිණුම් පිළිබඳ මුල්‍යාධිකාරීගේ වාර්තාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 63 (8) ඡේදයේ ප්‍රකාර මුල්‍යාධිකාරී විසින් කොමිෂන් සභාවේ සභාපති වෙත සැපයිය යුතු වාර්තාවයි.

ඉහත සඳහන් වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද මෙම ආයතනයේ ගිණුම් වාර්තාව කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන පොත්පත් හා ලේඛන අනුසාරයෙන් සකස් කරන ලද බවත් මාගේ වැටහීම හා විශ්වාසය අනුව එය සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.



ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය

ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
## කැලණිය විශ්වවිද්‍යාලය
## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

| වත්කම් | සටහන් | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | රු. | රු. | රු. | රු. |
| දේපළ යන්ත්‍ර හා උපකරණ | 01 | 9,542,898 | | 11,340,717 | |
| ආයෝජන | 02 | 7,043,706 | | 6,297,806 | |
| වෙනත් මූල්‍ය වත්කම් | 03 | 837,881 | 17,424,485 | 740,949 | 18,379,473 |
| ජංගම වත්කම් | | | | | |
| ගබඩා අත්තිකාරම් | 04 | 456,629 | | 338,602 | |
| පර්යේෂණ හා ප්‍රකාශන තොග | 05 | 1,142,616 | | 1,184,437 | |
| විවිධ ණයගැතියෝ | 06 | 188,688 | | 292,021 | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් | 07 | 2,697,539 | | 3,083,704 | |
| සේවා හා සැපයුම් අත්තිකාරම් | 08 | 1,012 | | 47,962 | |
| ඉදිරි ගෙවීම් | 09 | 821,985 | | 33,756 | |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 10 | 6,614,438 | | 6,477,454 | |
| වෙනත් තැන්පත් | 11 | 4,652,500 | 16,575,407 | 4,760,000 | 16,217,936 |
| මුළු වත්කම් | | | 33,999,892 | | 34,597,409 |
| බැරකම් | | | | | |
| ජංගම බැරකම් | | | | | |
| තැන්පත් | 12 | 53,144 | | 35,204 | |
| විවිධ ණයහිමියෝ | 13 | 50 | | 50 | |
| උපචිත වියදම් | 14 | 1,949,357 | | 1,730,293 | |
| වෙනත් වගකීම් | 15 | 509,408 | 2,511,960 | 217,621 | 1,983,168 |
| ජංගම නොවන බැරකම් | | | | | |
| වැය වූ මූලධන ආධාර | 16 | 11,745,940 | | 11,751,062 | |
| වැය නොවූ මූලධන ආධාර | 17 | 2,140,681 | 13,886,621 | 777,262 | 12,528,325 |
| සීමිත අරමුදල් | | | | | |
| විශේෂ අරමුදල් | 18 | 6,054,844 | | 5,366,719 | |
| පර්යේෂණ අරමුදල් | 19 | 961,310 | | 904,789 | |
| ත්‍යාග සහ ආධාර | 20 | 10,549,982 | | 10,496,042 | |
| වෙනත් අරමුදල් | 21 | 2,324,571 | | 1,815,621 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 22 | 4,179,875 | 24,070,583 | 4,504,383 | 23,087,555 |
| මුළු බැරකම් | | | 40,469,163 | | 37,599,047 |
| ශුද්ධ වත්කම් | | | (6,469,271) | | (3,001,638) |
| ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | | | |
| මූලධන ලැබීම් | | | | | |
| ප්‍රත්‍යාගණන ගිණුම | | 798,276 | | 798,276 | |
| ආයතනයේ පොදු සංචිතය | 23 | (7,267,547) | (6,469,271) | (3,799,915) | (3,001,638) |
| මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | (6,469,271) | | (3,001,638) |

පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

ජී.පී.එස්.එම්. දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | සටහන් | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| පුනරාවර්තන වැය සඳහා රජයේ ආධාර | | 11,417,000 | | 6,500,000 | |
| ණය පොලී | | 107,830 | | 127,271 | |
| පැරණි භාණ්ඩ වෙළඳාම | | - | | - | |
| විවිධ ආදායම් | 24 | 611,625 | | 500,090 | |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | | 575,000 | | 618,000 | |
| පාඨමාලා ගාස්තු (පශ්චාත් උපාධි) | | 17,368,279 | | 19,837,441 | |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | | 474,718 | | 161,000 | |
| පුස්තකාල ගාස්තු (පශ්චාත් උපාධි) | | 529,000 | | 570,000 | |
| ග්‍රන්ථ අලෙවිය | | 13,087 | | 8,643 | |
| පුස්තකාල දඩ | | 6,714 | | 3,775 | |
| වෙනත් ව්‍යාපෘති ආදායම් | | 4,119,759 | | 2,238,483 | |
| කපා හැරීම් | | 1,191,704 | | 1,158,314 | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | | 1,476,849 | | 641,147 | |
| මෙහෙයුම් ආදායම් එකතුව | | | 37,891,565 | | 32,364,163 |
| **මෙහෙයුම් වියදම** | | | | | |
| **පුද්ගලික වැටුප් හා වේතන** | | | | | |
| පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | 25 | 10,999,449 | | 9,487,571 | |
| අධ්‍යයන සේවා | 25 | 12,052,342 | | 9,107,616 | |
| ගමන් වියදම් | | 90,469 | | 469,260 | |
| සැපයීම් | | 1,986,845 | | 1,681,866 | |
| අලුත්වැඩියා හා නඩත්තු වියදම් | | 789,693 | | 512,393 | |
| ප්‍රවාහන, සන්නිවේදන හා ආවශ්‍යක සේවා | | 7,479,607 | | 7,741,277 | |
| ක්ෂය කිරීම් හා හිලව් වියදම් | | 3,047,842 | | 3,054,273 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 4,912,951 | | 3,019,876 | |
| මෙහෙයුම් වියදම් එකතුව | | | 41,359,197 | | 35,074,132 |
| ක්‍රියාකාරී මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | | | (3,467,632) | | (2,709,969) |
| **මූල්‍යමය පිරිවැය** | | | | | |
| දේපල උපකරණ අලෙවියෙන් ලත් ආදායම | | | - | | - |
| අදාල කාලයට ශුද්ධ අතිරික්තය/ඌණතාවය | | | (3,467,632) | | (2,709,969) |

නිවැරදි බවට සහතික කරමු.

පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

ඊ.පී.එස්.එම්. දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

<u>පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය</u>
<u>**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**</u>
<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය</u> | | | | |
| වර්ෂය සඳහා අතිරික්තය (ඌනතාවය) | | (3,467,632) | | (2,709,969) |
| මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් සඳහා ගැලපීම | | - | | - |
| පාරිතෝෂික | | (324,508) | | 482,483 |
| ක්ෂය | | 3,038,341 | | 2,551,362 |
| කපා හැරීම | | (1,191,704) | | (1,158,314) |
| | | (1,945,502) | | (834,439) |
| ඉකුත් කාලපරිච්ඡේදවල විෂයයන් | | - | | - |
| *කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය* | | **(1,945,502)** | | **(834,439)** |
| <u>කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම්</u> | | | | |
| ගබඩා අත්තිකාරම් සහ පර්යේෂණ හා ප්‍රකාශන තොග (වැඩිවීම)/අඩුවීම | (76,206) | | 80,157 | |
| විවිධ ණයගැතියෝ (වැඩිවීම)/අඩුවීම | 103,333 | | (117,194) | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 386,165 | | (112,146) | |
| සේවා සැපයීම අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 46,950 | | (12) | |
| ඉදිරි ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | (788,230) | | (22,686) | |
| ඉදිරි ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 107,500 | | (50,000) | |
| වෙනත් තැන්පත් (වැඩිවීම)/අඩුවීම | - | | - | |
| තැන්පත් හා විවිධ ණයහිමියෝ (වැඩිවීම)/අඩුවීම | 17,940 | | - | |
| උපචිත වියදම් හා වෙනත් බැරකම් (වැඩිවීම)/අඩුවීම | 510,851 | *308,304* | 1,265,929 | *1,044,048* |
| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ අගය* | | **(1,637,199)** | | **209,609** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය</u> | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (1,186,582) | | (1,081,489) | |
| වෙනත් ආයෝජන | (842,832) | | (864,346) | |
| *ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල්* | | **(2,029,413)** | | ***(1,945,835)*** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය</u> | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | 2,550,000 | | 1,600,000 | |
| ත්‍යාග සහ ආධාර | - | | - | |
| වෙනත් අරමුදල් | 1,253,596 | | 1,163,748 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් | | 3,803,596 | | 2,763,748 |
| *මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශුද්ධ වැඩිවීම* | | 136,984 | | 1,027,523 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය | | 6,477,454 | | 5,449,932 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය (සටහන1) | | 6,614,438 | | 6,477,454 |

| සටහන1 | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| බැංකු ශේෂය | 6,614,438 | 6,477,454 |
| වෙනත් බැංකු ශේෂ | - | - |
| | 6,614,438 | 6,477,454 |

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම් චලනය

| | පොදු සංචිත රු. | ප්‍රත්‍යාගණන රු. | එකතුව රු. |
|---|---|---|---|
| 2011-01-01 දිනට ශේෂය | (1,770,603) | 798,276 | (972,327) |
| 2011 වර්ෂයේ අතිරික්තය/(ඌණතාව) | 680,658 | - | 680,658 |
| 2012-1-1 දිනට ශේෂය | (1,089,946) | 798,276 | (291,669) |
| 2012 වර්ෂයේ අතිරික්තය/(ඌණතාව) | (2,709,969) | - | (2,709,969) |
| 2013-1-1 දිනට ශේෂය | (3,799,915) | 798,276 | (3,001,638) |
| 2013 වර්ෂයේ අතිරික්තය/(ඌණතාව) | (3,467,632) | - | (3,467,632) |
| 2013-12-31 දිනට ශේෂය | (7,267,547) | 798,276 | (6,469,271) |

<u>ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්</u>

**01. හඳුනාගත් ගණකාධිකරණ මූලධර්ම**

**1.1** *හැඳින්වීම*

**1.1.1** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව 1979 අංක 08 දරණ පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතන නියමාවලින් මගින් කැලණිය විශ්වවිද්‍යාලය හා අනුබද්ධිතව පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය පිහිටුවා ඇත.

**1.1.2** පාලි හා බෞද්ධ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි තත්වයේ ඉගැන්වීම්, පුහුණුවීම් හා පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම හා සම්බන්ධිත පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පිරිනැමීම මූලික කාර්ය කොටගෙන ඇත.

**02. මූල්‍ය ප්‍රකාශන**

මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවනතා ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් වලින් සමන්විත වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් චක්‍රලේඛ ලිපි අංක 03/2011 මගින් යොමු කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියන්ට අනුකූල වෙමින් ඉහත ගිණුම් ප්‍රකාශන සකස් කර ඇත.

**03. ස්ථාවර වත්කම් හා ප්‍රත්‍යාගණනය**

**3.1** *දේපල පිරියත හා උපකරණ*

**3.1.1** ***වත්කම් හඳුනා ගැනීම හා අගය කිරීම***

දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගය දැක්වෙන පරිදි දක්වා ඇත.

3.1.2 *ක්ෂය වෙන් කිරීම*

සරල මාර්ග ක්‍රමයට පහත පරිදි ජංගම වත්කම් ක්ෂය ප්‍රතිපාදනය කර ඇත.

| | |
|---|---|
| ලී බඩු හා සවි කිරීම | 10% |
| කාර්යාල ලී බඩු හා උපකරණ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 20% |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 20% |
| රථ වාහන | 20% |

3.2 *තොගය*

පිරිවැය පදනම් කරගෙන ප්‍ර. ලැ. ප. නි. (FIFO) ක්‍රමයට ආගණනය කර ඇත.

3.3. *ණයගැතියෝ*

ණය ගැතියන් ලෙස දක්වෙන්නේ කාර්ය මණ්ඩලයට ගෙවන අත්තිකාරම් වේ. මෙම ණය හා අත්තිකාරම් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය ඇපයට තබා ලබා දෙන බැවින් ආපසු අයකර ගැනීමේ අවධානමක් නැත. ඒ අනුව බොල් ණය හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සලසා නැත.

04. **වගකීම්**

4.1. *විශ්‍රාම පාරිතෝෂිත*

1983 අංක 12 දරණ පාරිතෝෂිත පනතට අනුව සුදුසුකම් ලත් සේවකයන් වෙනුවෙන් ගණනය කිරීම සිදු කර ඇත.

## 21. 2009 – 2013 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.

| වර්ෂය | පුනරාවර්තන සඳහා රජයේ ආධාර | 102 - මූලධන සඳහා රජයේ ආධාර | තොරතුරු තාක්ෂණ සඳහා රජයේ ආධාර | ආයතනික ඉපයීම් | මුළු පුනරාවර්තන ආදායම | මුළු පුනරාවර්තන වියදම | පුනරාවර්තන මූල්‍යකටයුතු වල ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| 2009 | 6,000,000 | 85,000 | – | 17,955,534 | 23,955,534 | 23,245,122 | 710,412 |
| 2010 | 7,900,000 | 400,000 | – | 28,878,711 | 28,878,711 | 25,070,959 | 3,807,753 |
| 2011 | 7,314,146 | 750,000 | – | 29,121,279 | 29,121,279 | 28,440,621 | 680,658 |
| 2012 | 6,500,000 | 1,600,000 | – | 25,864,163 | 32,364,163 | 35,074,132 | -2,709,969 |
| 2013 | 11,417,000 | 2,550,000 | – | 26,474,565 | 37,891,565 | 41,359,197 | -3,467,632 |

**22.** කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **108(02)** වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසී/එෆ්/පීඅයිපීබීඑස්/ 1/13/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 පෙබරවාරි 10 දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් - 01. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
02. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
03. ලේකම් - මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
04. ලේකම් - මුදල් අමාත්‍යාංශය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසි/එච්/ පිඅයිපිබීඑස් / 1/13/14 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2015 පෙබරවාරි 10 දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2014 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 | +94-11-2887223 | oaggov@sltnet.lk | www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 2.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය ලෙස එදිනට තොග සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන තොගය වන රු.385,676 ක් දැක්වීම වෙනුවට පොත් ශේෂය වන රු.456,629 දැක්වීම හේතුවෙන් රු.70,953 ක් වැඩියෙන් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ත්‍යාග සහ ආධාර යටතේ ලැබී තිබු වටිනාකම රු.637,957 ක් වූ පරිගණක 03 ක්, මුද්‍රණ යන්ත්‍රයක් සහ වෑන් රථයක් ඉකුත් වර්ෂවලදී අලෙවි කර තිබු නමුත්, 2013 දෙසැම්බර් 31 දින වනවිටත් ත්‍යාග සහ ආධාර ගිණුමට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 නොසැසඳූ පාලන ගිණුම

2013 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබු "ප්‍රකාශන තොගය" රු.1,142,616 ක් වූ අතර ගබඩා ලේඛන අනුව එදිනට එම ශේෂය රු.1,024,368 ක් වූයෙන් එම ශේෂ අතර රු.118,248 ක වෙනසක් විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව තිබු එකතුව රු.179,521 ක් වූ වර්ෂ 5 ට වැඩි ණය 2013 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුල්‍ය ප්‍රකාශනවල වෙනත් ජංගම බැරකම් යටතේ දක්වා තිබු වසර 05 කට වඩා වැඩි කාලයක සිට පැවති එකතුව රු.18,249 ක් වූ බැරකම් 02 ක් සහ වසර 02 ක ට වැඩි කාලයක සිට ගිණුම්වල පෙන්වා තිබු ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු රු.4,000 ක් 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

Auditor General's Department

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව දෙසැම්බර් 31 දිනට වූ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩයන් හි ඌනතාවය ඒකක 83 ක් වූ අතර භාණ්ඩ අතිරික්තය 342 ක් විය. මෙම අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ගයන් ගෙන නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ එකතුව රු.5,389,165 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීමේ ලේඛන සහ නිවාඩු ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගබඩාවේ හා අනෙකුත් අංශවල අබලි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණ අතර ස්ථාවර වත්කම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන උපලේඛනය අතර රු.4,019,813 ක වෙනසක් නිරීක්ෂණය විය. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

විශ්‍රාම ලැබූ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරිවරයා 2013 අප්‍රේල් 17 දින සිට එම තනතුර සඳහා මාස 06 ක කාලයක් වෙනුවෙන් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත පමණක් පත්කර ඒ වෙනුවෙන් රු.60,000 ක මාසික දීමනාවක් ගෙවීමට කටයුතු කර තිබුණි. 2013 ඔක්තෝබර් 17 දින සිට ඉදිරියට උපරිම මාස 06 ක කාලයක් සඳහා නැවතත් එම නිලධාරියාගේ සේවය ලබා ගැනීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන තිබුණි. කැබිනට් අනුමැතියකින් තොරව සේවා අවශ්‍යතාවය මත යැයි සඳහන් කර එකී පත්වීම සිදුකර, 2013 අප්‍රේල් 17 දින සිට 2014 අප්‍රේල් 12 දින දක්වා රු.718,064 ක දීමනා ගෙවා තිබූ අතර ජංගම හා සෘජු දුරකථන බිල්පත් වෙනුවෙන් රු.30,607 ක් ප්‍රතිපූරණය කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 3,467,632 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,709,969 ක් විය. මෙ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.757,663 කින් වැඩි වී තිබූ අතර එසේ ඌනතාවය වැඩිවීමට පාඨමාලා ආදායම රු.2,469,162 කින් අඩුවීම සහ අධ්‍යයන සේවා වැටුප් හා වේතන රු.2,944,726 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අධ්‍යයන කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් පවත්වා තිබූ එක් අවුරුදු පාඨමාලා 07 න් බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව, බෞද්ධායුර්වේද උපදේශන අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා වූ ශිෂ්‍ය ලියාපදිංචිය සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 16 ක් පමණ විය.

(ආ) සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය හා සසඳන විට බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා මුළු ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 82 ක් වූ වැඩි දායකත්වයක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සිංගප්පූරුව) හා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංගප්පූරුව) සඳහා සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 2 ක් පමණ වූ අඩුම ශිෂ්‍ය දායකත්වයක් විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඇ) විභාගවලට පෙනී සිටීම හා විභාග ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ සමස්ථ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 456 ක් වූ අතර, විභාග වලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 373 ක් හා සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 298 ක් විය.

(ii) ආයතනය විසින් පවත්වනු ලැබූ බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය හා බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධි හදාරන ලද 203 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 17 ක් පමණක් විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1984 සිට ආරම්භ කර තිබූ ඊ.ඩබ්.ගුණතිලක අරමුදලෙහි 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු.226,987 ක් හා විදේශ ශිෂ්‍යත්ව ආධාර රු.736,094 ක් වසර ගණනාවක සිට අදාල අරමුණ සඳහා උපයෝගී කර ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.38,212 ක් වූ බැහැර ගෙන යාමට ලබා දී, ආපසු භාරනොදුන් පුස්තකාල පොත් 170 ක් වූ අතර පොත් ලබා ගත් පුද්ගලයන් ස්ථානය හැර ගොස් තිබීම සහ මිය යාම හේතුවෙන් මෙම පොත් ආපසු ලබා ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

## 4.3 සේවක මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ අනුමත කාර්යමණ්ඩලය සැසඳීමේදී පුරප්පාඩු 02 ක් පමණක් පවතින බව නිරීක්ෂණය විය.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය විසින් 2013 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම නිශ්චිත ආකෘතියකට අනුව හා ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් අනාවරණය කර ගත හැකි වන සේ ක්‍රියාකාරකම, නිම කිරීමට අපේක්ෂිත කාල රාමුව, අයවැයගත ප්‍රතිපාදන, වියදම් මූල්‍යනය කිරීම, අනුමත වගකීම් දරන නිලධාරියා යන කරුණු ද ඇතුළත්ව පිළියෙල කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ සඳහන්ව තිබුණු ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය හා බෞද්ධ අයුර්වේද උපදේශන පාඨමාලා හා නව පාඨමාලා සඳහා ප්‍රායෝගික අධ්‍යාපනය වෙනුවෙන් නව අංශයක් ස්ථාපිත කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර ගෙන නොතිබුණි.

AGDSL
Auditor General's Department

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 161 දක්වා පරාසයක විචලනයන් පැවතිණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) පුස්තකාල පාලනය
(ඉ) වාහන පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
UNIVERSITY OF KELANIYA - SRI LANKA

No. 113, Dutugemunu Street, Kohuwala.

නො. 113, දුටුගැමුණු වීදිය, කොහුවල.

මගේ අංකය :
My No : PIPBS/ST/03/2015- 02

ඔබේ අංකය :
Your No :

2015.02.26

ලියාපදිංචි තැපැල

වැඩ බලන විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් අංක ඊයි/එජ්/පීඅයිපීබීඑස්/1/13/14 හා 2015.02.10 වැනි දිනැතිව එවා ඇති ලිපියට අනුව අදාළ පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2014 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී තොග සමීක්ෂණ වාර්තාවේ අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට දැනටමත් කටයුතු කර ඇති අතර 2005 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට පැවත ගෙන වෙනස සඳහා සොයාගත් හේතු කැලණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක වෙත යොමු කොට ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත හැකි වනු ඇත.

(ආ) 2014 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කිරීමට දැනටමත් පියවර ගෙන ඇත.

- අනෙක් පිට -

2.2.2 නොසැසඳු පාලන ගිණුම

මෙම ප්‍රකාශනවල තොගයේ වෙනස්කම් ඇතිවීමට පහත සඳහන් කරුණු බලපා ඇත.

මෙම ආයතනය මගින් ප්‍රකාශන, ප්‍රකාශයට පත් කිරීමට ආරම්භ කළේ 1996 වර්ෂයේ, ආයතනය කොළඹ 05 ගවර් වීදියේ අංක 09 දරන ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යන කාලයේ සිටය. එහිදී ප්‍රකාශන තොග ගබඩාකර තබා ගැනීමට වෙනමම ඉඩකඩක් නොතිබුණි. එමනිසා ආයතන පුස්තකාල කාර්යාලයේ කොටසක සහ ගොඩනැගිල්ලේ ඉඩ ඇති තැන්වල මෙම පොත් අහුරා තබන ලදී. එම වකවානුවේදී අධික වර්ෂා සහිත කාලවල ජලය ආයතන ගොඩනැගිල්ලට ගලා ඒමෙන් පොත්වලට හානි සිදු වී ඇත.

එසේ ම ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති නිසාත් ගබඩා පහසුකම් නොමැති නිසාත් කුලී ස්ථානවලට ගෙන යාමේදී ද මෙම ප්‍රකාශනවලට හානි සිදු වී ඇත.

ඒ අනුව කෙටුම්පත් විගණන වාර්තාවේ දක්වා ඇති ඒකක 304 තොග වෙනස 1996 සිට 2013 දක්වා කාලය තුළ ඉහත පරිදි විවිධ හේතු මත සිදු වූ මහ හැරීම් වන අතර මේ පිළිබඳව අදාළ අධිකාරීන් වෙත ඉදිරිපත් කර තීරණයක් ගැනීමට නියමිතයි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම

(අ) ණය ගැති ශේෂ රු.179,521 සඳහා පහත පරිදි කටයුතු කර ඇත.

1. විවිධ ණය ගැතියෝ - 855 - ඉදිරියේදී කතෘභාග ගෙවීමේදී පියවීම සඳහා
2. අධ්‍යාපන සේවකයන්ගේ සමුපකාර සමිතිය (EDCS)- 4694 – 2015දී පියවීමට කටයුතු කර ඇත.
3. වාහන අලුත්වැඩියා වියදම. - <u>173972</u> - 2014 සිට ඉදිරි වසරවලදී පියවීමට කටයුතු කර ඇත.
   179521

(ආ) 2014 අවසන් ගිණුම්වලදී නිවැරදි කිරීමට දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත.

2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

(අ) මෙම භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් හඳුනා ගෙන ඇති භාණ්ඩවලට අදාළ ඉන්වෙන්ට්‍රි ලේඛන අදාළ අංශ වලින් යාවත්කාලීන නොවීම හේතුවෙන් මෙම අඩුපාඩුව සිදු වී ඇත. ආයතනය දැනට නව ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීම නිසා මෙම භාණ්ඩ නැවත අංශ අතර බෙදා හැරීම 2014 වර්ෂයට යාවත්කාලීන කරමින් පවතින ස්ථාවර වත්කම් ලේඛනය හා ඒ සමඟ සකස් කරනු ලබන නව ඉන්වෙන්ට්‍රි ලේඛන මගින් සිදු කරනු ඇත. 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය ඉතා ඉක්මනින් සිදුකර සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. අංශ සඳහා වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කිරීම මගින් 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා වූ ඌනතාවන් හා අතිරික්තයන් පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සිදු කරනු ඇත.

- අනෙක් පිට -

(ආ) 2013 වර්ෂයේදී පැවැති ව්‍යාපාර පොදු කාරක සභා පාර්ලිමේන්තු රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ පැමිණීම හා දේශන පැවැත්වීම සම්බන්ධව සියලු වාර්තාවන් පෞද්ගලික දින පොත්වල සටහන් තබා ගන්නා බව දැනුම් දී ඇත.

(ඇ) 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් වූ පසු හඳුනාගත් සියලු අබලි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර අවසන් ගිණුම් සමග සංසන්දනය කර ගෙන යන අතර 2015 වර්ෂයේ මුල් මාස 06 තුළ සියලු කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ආයතනයේ සමස්ත ගිණුම් කටයුතු සඳහා පවතින එකම ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුර පුරප්පාඩු වීමෙන් ආයතනික ගිණුම් කටයුතු අඩාලවීම වළක්වා ගැනීම හා එම තනතුරෙහි වෙනත් අත්‍යවශ්‍ය නිදහස් කිරීම් වලදී අනිවාර්යෙන් ඇති විය හැකිව තිබූ බාධාවන් මගහරවා ගැනීම සඳහා කළමනාකාර මණ්ඩලය විසින් මෙම පත්වීම සිදු කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. එම තනතුරට අදාළ අත්‍යවශ්‍ය කාර්ය පැවරීම් හා අනෙකුත් සියලුම රාජකාරී ඉටු කරවා ගැනීමේ පදනම මත මෙම පත්වීම කර ගැනීමට සිදු වූ අතර එම තනතුරට අදාළව අවසාන වරට ලැබූ ඉපයීම් හා රාජකාරී වරප්‍රසාද මත ගෙවීම් සිදු කර ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අධ්‍යයන කාර්ය සාධනය

(අ) ශිෂ්‍ය ලියාපදිංචිය

(අ)අදාළ වර්ෂවල එක් එක් පාඨමාලා සඳහා පවතින ශිෂ්‍ය ඉල්ලුම මත මෙය තීරණය වේ.

(ආ) පසුගිය වර්ෂ ගණනාවක් මුළුල්ලේ සලකා බලන විට බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා වැඩි ඉල්ලුමක් පවතින බව පෙනී යන බැවින් මෙය ආයතනයේ සාමාන්‍ය තත්වය වේ. අනෙකුත් පාඨමාලාවන් වඩා ප්‍රචලිත කිරීමට අවශ්‍ය පියවරයන් ගනු ලැබේ.

- අනෙක් පිට -

(ඇ) විභාගවලට පෙනී සිටීම හා විභාග ප්‍රතිඵල

ඒ ඒ පාඨමාලා සඳහා ශිෂ්‍ය ප්‍රතිශතය තීරණය වන්නේ ජාතික හා ජාත්‍යන්තර ශිෂ්‍යයන්ගේ ඉල්ලීම සහ එකී ආයතනය පිහිටා ඇති පරිසරයට සාපේක්ෂවයි.

(ඇ) (i) 2013 වර්ෂයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව වර්ෂාවසානය වන විට අපට පාලනය කළ නොහැකි යම් යම් හේතු සාධක නිසා කිසියම් පිරිසක් පාඨමාලාවන් අතහැර ගොස් තිබේ.

විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් කිසියම් පිරිසක් අසමත් වීම සාමන්‍ය තත්වයකි. ඒ ඒ ශිෂ්‍යයන්ගේ සක්‍යතාව මත එය සිදුවේ.

(ii) දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයන් වසර දෙකක හෝ තුනක කාල පරිච්ඡේදයක් සිය පර්යේෂණ කාර්යයේ යෙදිය යුතුය. ඇතැම් විට එම කාලය වසර පහත් දක්වා ද දීර්ඝ වේ. පර්යේෂණ ශිෂ්‍යයන් සිය පර්යේෂණ අවසන් කිරීම් සිදු කරන්නේ පූර්ණ කාලීන ශිෂ්‍යයන් ලෙස නොවන බැවින් ද විවිධ දුෂ්කරතා හා අපහසුතා මැද එම කාර්යයේ යෙදෙන බැවින් 2013 වර්ෂයේ 17 දෙනෙකු සිය පර්යේෂණයන් අවසන් කිරීම සමස්තයක් ලෙස උසස් ප්‍රවණතාවක් බව කිව හැකිය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මෙම කරුණ සම්බන්ධව ගත් තීරණයක් අනුව 2015 වර්ෂයේ සිට මෙම ශිෂ්‍යත්වය පිරිනමනු ඇත.

(ආ) බාර නොදුන් පුස්තකාල පොත් 170ක ප්‍රමාණය 1994 වසරේ සිට 2013 වසර දක්වා (වසර 19ක) වූ කාලයට අයත් වේ. ආයතන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මෙ සම්බන්ධව වැඩිදුරටත් කටයුතු කිරීමට තීරණය කර තිබේ.

4.3 සේවක මණ්ඩල පරිපාලනය

නිරීක්ෂණය සත්‍ය වේ.
මෙම පුරප්පාඩු 2014 වර්ෂයේදී පුරවා ඇත. ඒ අනුව 2013 වර්ෂයට අනුමත කාර්ය මණ්ඩලය සංතෘප්තය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

පෙන්වා දී තිබූ අඩුපාඩු අනුව ක්‍රියාකර 2014 වර්ෂයේ මෙය නිසියාකාරව සකස් කර ඇත.
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන්ව තිබූ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ ඉඩම නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු සහගත තත්වය නිසා එම ඉඩම පවරා ගැනීමට අදාළ කාර්යය නතර කිරීමට සිදුවිය. ඒ අනුව ඉහත කාර්ය ද ඇතුළුව ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග අදාළ වර්ෂය තුළ නිරන්තරව ක්‍රියාත්මක කරමින් තිබූ බව වැඩිදුරටත් දන්වමි. මෙම කරුණු කළමනාකාර මණ්ඩල රැස්වීම්වලද වාර්තා වී ඇත.

- අනෙක් පිට -

5.2 <u>අයවැය ලේඛනමය පාලනය</u>

ඉදිරියේදී ද මෙ සඳහා තවදුරටත් අවධානය යොමු කිරීමට සටහන් කර ගනිමි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) ගිණුම්කරණය, (ආ) ගබඩා පාලනය , (ඇ) ස්ථාවර වත්කම් ලේඛනය
(ඈ) පුස්තකාල පාලනය, (ඉ) වාහන පාලනය

2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් ඉදිරියේදී අඩුපාඩු අවම වන ආකාරයට කටයුතු කරනු ලැබේ.

ඉහත වාර්තාවෙ සඳහන් කරුණු සම්බන්ධයෙන් සපයා ඇති පැහැදිලි කිරීම් පිළිබඳව මම පෞද්ගලිකව ම වගවන බව මෙයින් සහතික කරමි.

මෙයට,

මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි,
අධ්‍යක්ෂ

පිටපත් : 01. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
02. සභාපති - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව
03. ලේකම් - මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
04. ලේකම් - මුදල් අමාත්‍යාංශය